Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

අගෝස්තු 3 වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)


# ඇතිල්ලීමෙන්, පෙළීමෙන්, පිඹීමෙන් හඬ නිපදවියහැකි සංගීත මෙවලම් සකසමු.

**විවිධ සංගීත භාණ්ඩවල හඬ ආසන්න වශයෙන් උපදවා ගත හැකි මෙවලම් සකස්කර ගැනීම සඳහා අපට පරිසරයෙන් සපයාගත හැකි විවිධ ද්‍රව්‍ය ගැන හඳුනා ගනිමු.**


<u>ක්‍රියාකාරකම</u>

(පිඹීමෙන් හඬ උපදින ආදේශ භාණ්ඩයක් නිර්මාණය කිරීම.)

ඉවත දමන ප්ලැටිග්නම් පෑන් බට හෝ වයරින් බට තුනක් රැගෙන එම බට සිරස්ව පිහිටන ලෙස මුඛය තබා පිඹීමට හැකිවන පරිදි නලයක් ලෙස සෙලෝටේප් හෝ නූල් ආධාරයෙන් සකසාගන්න.



පොහවන ලද කඩදාසි එක් පැත්තකින් සවි කරන්න. ස ස්වරයේ හඬ නිවැරදිව ලබාගැනීම සඳහා පොහවනලද කඩදාසි කොල ගුලිය නලයේ එහා මෙහා ගෙනයන්න. එවිට නාදය ඉහළ පහළ යන බව හොඳින් අවධානයට ගන්න.එමෙන්ම විවිධ ප්‍රමාණයේ නල යොදාගනිමින්ද පහත ආකාරයට මෙම ආදේශ භාණ්ඩය සකස්කළ හැකිවේ. https://www.youtube.com/watch?v=OS0ZTdMg3cQ






## අභ්‍යාසය

(වැරදි වචනය කපා හරින්න.)

නලය දිග වැඩිවූ විට හඬ | ඉහළ | පහළ | යයි.

නලය දිග අඩුවූ විට හඬ | ඉහළ | පහළ | යයි.